ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමණාකරණ අධ්‍යයන ගෞරව උපාධි පාඨමාලාව
4 වන මට්ටම: II වන සමාසිකය
AFU4574 අන්තර් ගිණුම්කරණය (Intermediate Accounting)
අවසාන පරීක්ෂණය – 2024/2025
කාලය පැය තුනයි (03)

දිනය: 11.01.2026 වේලාව: ප.ව.1.30 - ප.ව.4.30

උපදෙස්:

- ප්‍රශ්න අංක 01ට සහ II කොටසින් තවත් ප්‍රශ්න තුන (03)කට පිළිතුරු සැපයිය යුතුයි.
- සියළුම පෙරවැඩ පැහැදිලිව පෙන්වන්න.
- වැඩසටහන් සම්පාදනය කල නොහැකි ගණක යන්ත්‍ර පමණක් භාවිතා කල හැක.

## 1 කොටස (අනිවාර්ය ප්‍රශ්නය)

### ප්‍රශ්න අංක 01

අ). 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති සමාගම් වලට අදාලව "සංවිත" යන්නෙහි තේරුම සුදුසු උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 05)

ආ). පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශනවල අරමුණ පැහැදිලි කරන්න. (ලකුණු 06)

ඇ). 2025 මාර්තු 31 වන දිනට ගගන පීඑල්සී හි ගිණුම් පොත්වලින් පහත සඳහන් ශේෂ පිරික්සුම උපුටා ගන්නා ලදී.

2025 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම (රු.'000)

| | හර | බැර |
|---|---|---|
| විකුණුම් පිරිවැය/ විකුණුම් | 18,000 | 40,000 |
| 2025 මාර්තු 31 දිනට තොගය | 2,400 | |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | 7,000 | |
| පරිපාලන වියදම් | 2,700 | |
| බෙදාහැරීමේ වියදම් | 1,400 | |
| දේපල, පිරියත හා උපකරණ – පිරිවැය / ප්‍රත්‍යාගණන අගයට | | |
| ඉඩම් | 12,000 | |
| ගොඩනැගිලි | 19,000 | |
| මෝටර් රථ | 15,000 | |
| කාර්යාල උපකරණ | 3,000 | |
| 2024 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය | | |
| ගොඩනැගිලි | | 5,000 |
| මෝටර් රථ | | 6,000 |
| කාර්යාල උපකරණ | | 400 |
| බැංකු මුදල් | 2,100 | |
| අතැති මුදල් | 600 | |
| වෙළඳ ණයගැතියන්/ වෙළඳ ණයහිමියන් | 4,000 | 3,200 |
| 2024 අප්‍රේල් 01 දිනට ණයගැතියන් හානිකරණ අලාභ සඳහා වෙන්කිරීම | | 500 |

| | | |
|---|---|---|
| සාමාන්‍ය කොටස් වල අයෝජන | 5,000 | |
| ගෙවූ ආදායම් බදු | 1,100 | |
| ගෙවූ අතුරු ලාභාංශ | 300 | |
| වෙනත් ගෙවිය යුතු දෑ | | 600 |
| දිගු කාලීන බැංකු ණය | | 5,000 |
| වෙනත් වියදම් | 1,400 | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් 2,000,000 | | 24,000 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 3,000 |
| 2024 අප්‍රෙල් 01 දිනට රඳවාගත් ඉපයුම් | | 7,000 |
| 2024 අප්‍රේල් 01 දිනට ගෙවිය යුතු අදායම් බදු | | 300 |
| | 95,000 | 95,000 |

පහත අමතර තොරතුරු ඔබ වෙත සපයා ඇත.

- 2024 අප්‍රේල් 1 වන දින සමාගමේ මෝටර් රථය රු. 8,000,000 කට විකුණන ලදී. මෝටර් රථය විකිණීමෙන් ලද මුදල් බැංකු ගිණුමට හර කර විකුණුම් ගිණුමට බැර කර ඇත. ඊට අමතරව, මේ සම්බන්ධයෙන් ගිණුම් පොත්වල කිසිදු සටහනක් සිදු කර නොමැත.

- වසර අවසානයේ සිදු කල භෞතික තොග ගණනයේදී අවසාන තොගය තුළ රු. 500,000 ක් වූ මන්දගාමීව චලනය වන තොගයක් ඇතුළත් වන බව අණාවරණය විය. මෙම තොගය 2025 අප්‍රේල් 5 වන දින පාරිභෝගිකයෙකුට රු. 100,000 කට විකුණන ලදී.

- සරල මාර්ග ක්‍රමයට දේපල, පිරියත හා උපකරණ පහත පරිදි ක්ෂය කරනු ලැබේ.
    - ගොඩනැගිලි: වාර්ෂිකව 5%
    - මෝටර් රථ: වාර්ෂිකව 10%
    - කාර්යාල උපකරණ: වාර්ෂිකව 20%

- සමාගම රු. 80,000 ක මුදලක් බොල් ණය ලෙස කපා හැරීමට තීරණය කල අතර සහ ඉතිරි වෙළඳ ලැබිය යුතු ශේෂය මත 10% ක හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදනයක් පවත්වා ගැනීමට තීරණය කරන ලදී.

- 2024/25 තක්සේරු වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු.1,200,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ සිදු කරන ලද ආදායම් බදු ගෙවීම් "ගෙවූ ආදායම් බදු" ගිණුමේ සටහන් කර ඇති අතර, එය තුළ 2023/24 වර්ෂය සඳහා අවසාන බදු ගෙවීම ලෙස ගෙවන ලද රු. 200,000 ක් ඇතුළත් වේ.

- සෑම වසර දෙකකට වරක් ඉඩම ප්‍රත්‍යාගණනය කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ. මෙම ප්‍රතිපත්තියට අනුව, 2025 මාර්තු 31 වන දින ඉඩම රු. 17,000,000කට ප්‍රත්‍යාගණනය කරන ලදී. කෙසේ වෙතත්, මෙම ප්‍රත්‍යාගණනය ගිණුම් පොත්වල සටහන් කර නොමැත.

- වසර තුළ, සමාගම සිය නව පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කර 2025 ජනවාරි 1 වන දින සිට එය සමාගමේ භාවිතය සඳහා යොදා ගන්නා ලදී. මෙම ගොඩනැගිල්ල සඳහා දරන ලද මුළු ඉදිකිරීම් පිරිවැය ප්‍රාග්ධන නොනිමි වැඩ ගිණුමේ සටහන් කර ඇත. මෙම පිරිවැයෙන් කොටසක් 2024 ජනවාරි 1 වන දින 10% ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ ලබාගත් රු.5,000,000ක බැංකු ණය හරහා මූල්‍යකරණය කරන ලදී. ණය ආපසු ගෙවීම 2026 ජනවාරි 1 වන දින සිට ආරම්භ වන අතර, වාර්ෂිකව රු. 1,000,000 බැගින් සමාන වාරික පහකින් ණය මුදල ආපසු ගෙවනු ලැබේ.

ඔබ විසින් ගහන පිල්සී සඳහා පහත දෑ පිලියෙල කල යුතු වේ.

(i) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(ii) 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

(iii) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(iv) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපල, පිරියත හා උපකරණ වෙනස් වීම නිරූපණය කරන ප්‍රකාශනය. (ලකුණු 29)

(මුළු ලකුණු 40)

## II කොටස

**ප්‍රශ්න අංක 02**

අ). ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ට අනුව "මුදල් සහ මුදල් සමාන දෑ" යන යෙදුම පැහැදිලි කරන්න. (ලකුණු 04)

ආ). 2024 මාර්තු 31 සහ 2025 මාර්තු 31 දිනට බීටා ලිමිටඩ් හි මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත දැක්වේ:

බීටා ලිමිටඩ්

| මාර්තු 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය | 2025 | 2024 |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | රු.'000 | රු.'000 |
| දේපල, පිරියත හා උපකරණ | 5,300 | 4,700 |
| අඩුකලා: සමුච්චිත ක්ෂය | (830) | (700) |
| ධාරණ අගය | 4,470 | 4,000 |
| ජංගම වත්කම් | | |
| තොග | 730 | 1,075 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 2,100 | 1,600 |
| මුදල් හා මුදල් සමාන දෑ | 1,200 | 1,100 |
| | 4,030 | 3,775 |
| මුළු වත්කම් | 8,500 | 7,775 |
| හිමිකම් හා වගකීම් | | |
| හිමිකම්: | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 5,500 | 5,000 |
| රඳවාගත් ඉපයුම් | 830 | 375 |
| | 6,330 | 5,375 |
| ජංගම නොවන වගකීම් | | |
| ණයකර | 1,200 | 1,200 |
| කල්බදු වගකීම | 400 | 570 |
| | 1,600 | 1,770 |
| ජංගම වගකීම් | | |
| වෙලඳ ගෙවිය යුතු දෑ | 250 | 320 |
| කල්බදු වගකීමේ ජංගම කොටස | 120 | 170 |
| ගෙවිය යුතු අදායම් බදු | 200 | 140 |
| | 570 | 630 |
| මුළු හිමිකම් හා වගකීම් | 8,500 | 7,775 |

පහත අමතර තොරතුරු ඔබ වෙත සපයා ඇත.

- 2024 ජුනි 1 වන දින උපකරණයක් රු.1,200,000 කට ඉවත් කරන ලදී. උපකරණයේ පිරිවැය රු.1,400,000 ක් වූ අතර 2024 ජුනි 1 වන දිනට එහි සමුච්චිත ක්ෂයවීම් රු.150,000 කි. මෙම ගනුදෙනුවට අමතරව, දේපල, පිරියත සහ උපකරණ වටිනාකමේ වෙනස ලෙස 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ මෝටර් රථයක් මිලදී ගැනීමක් නිරූපණය කරයි.
- වර්ෂය සඳහා වන ණයකර සහ කල්බදු සඳහා පොලී වියදම් රු. 210,000 ක් වූ අතර, එය වර්ෂය තුළ ගෙවා ඇත.
- 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් බදු වියදම රු. 250,000 කි.
- 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ සමාගම රු. 105,000 ක ලාභාංශ ගෙවන ලදී.

ඔබ විසින් 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බීටා ලිමිටඩ් සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය භාවිතා කරමින් පිලියෙල කිරීම අවශ්‍ය වේ. (ලකුණු 16)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 03

2024 මාර්තු 31 දිනෙන් සහ 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂ සඳහා සිල්වා (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා (රු.'000)

| | |
|---|---|
| විකුණුම් | 22,170 |
| විකුණුම් පිරිවැය | 12,620 |
| වෙනත් ආදායම් | 1,600 |
| පරිපාලන වියදම් | 3,590 |
| බෙදාහැරීමේ වියදම් | 2,070 |
| මූල්‍ය වියදම් | 780 |
| අදායම් බදු වියදම | 1,250 |

| | 2024 මාර්තු 31 දිනට (රු.'000) | 2025 මාර්තු 31 දිනට (රු.'000) |
|---|---|---|
| දේපල, පිරියත හා උපකරණ | 21,300 | 20,600 |
| තොගය | 1,450 | 1,130 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 1,640 | 1,310 |
| මුදල් හා මුදල් සමාන දෑ | 710 | 600 |
| බැංකු ණය | 5,750 | 6,340 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 1,480 | 1,570 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 16,000 | 15,000 |
| රඳවාගත් ඉපයුම් | 1,870 | 730 |

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත අනුපාත ගණනය කර ඇත:

| | | | |
|---|---|---|---|
| දළ ලාභ අනුපාතය | 51% | ක්ෂණික අනුපාතය | වාර 1.8 |
| ශුද්ධ ලාභ අනුපාතය | 18% | තොග පිරිවැටුම් අනුපාතය | වාර 9.1 |
| වත්කම් මත ඉපයුම | 22% | ණයගැති පිරිවැටුම් අනුපාතය | වාර 7.4 |
| හිමිකම් මත ඉපයුම | 10% | දේපල, පිරියත හා උපකරණ පිරිවැටුම් අනුපාතය | වාර 1.9 |
| ජංගම අනුපාතය | වාර 2.2 | පොලී ආවරණ අනුපාතය | වාර 2.5 |

ඔබ විසින් පහත දෑ පිළියෙල කල යුතු වේ.

අ). 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉහත තොරතුරු පදනම් කරගෙන පහත ගිණුම්කරන අනුපාත ගණනය කරන්න.

(i) දළ ලාභ අනුපාතය
(ii) ශුද්ධ ලාභ අනුපාතය
(iii) වත්කම් මත ඉපයුම
(iv) හිමිකම් මත ඉපයුම
(v) ජංගම අනුපාතය
(vi) ක්ෂණික අනුපාතය
(vii) තොග පිරිවැටුම් අනුපාතය
(viii) වෙළඳ ලැබිය යුතු දෑ පිරිවැටුම් අනුපාතය
(ix) දේපල, පිරියත හා උපකරණ පිරිවැටුම් අනුපාතය
(x) පොලී ආවරණ අනුපාතය

(ලකුණු 10)

ආ). ඉහත ගණනය කරන ලද මූල්‍ය අනුපාත මත පදනම්ව, 2025 මාර්තු 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා සිල්වා (පුද්ගලික) සමාගමේ කාර්ය සාධනය විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 04

අ). යම් මූල්‍ය වර්ෂයක ලාභ හෝ අලාභ බෙදා හැරීම සම්බන්ධයෙන් හවුල් ආඥාපනතේ 24 වන වගන්තිය අදාල වන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 06)

ආ). නෙලුම් සහ ඕලු පිළිවෙලින් 3:2 අනුපාතයට ලාභ හා අලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. 2024 අප්‍රේල් 1 වන දින, රු. 1,400,000 ක මුදල් ප්‍රාග්ධනයක් සහිතව හවුල්කරුවෙකු ලෙස මානෙල් ව්‍යාපාරයට ඇතුළත් කරන ලදී. නව හවුල්කාරිත්ව ගිවිසුමට පහත කොන්දේසි ඇතුළත් වේ.

- ව්‍යාපාරයට ලබා දුන් ප්‍රාග්ධනය සඳහා හවුල්කරුවන්ට 5% ක පොලියක් ලැබීමට හිමිකම් ඇත.
- හවුල්කරුවන්ගේ මාසික වැටුප්: නෙලුම්ට රු. 10,000 ක්, ඕලුට රු. 15,000 ක් සහ මානෙල්ට රු. 10,000 ක් වේ.
- නෙලුම්, ඕලු සහ මානෙල් අතර ලාභ බෙදා ගැනීමේ අනුපාතය පිළිවෙලින් 2:2:1 වේ.
- මානෙල් ඇතුළත් වූ පසු, ව්‍යාපාරයේ කීර්තිනාමය රු.1,500,000 ක් ලෙස තක්සේරු කරන ලදී.

2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ හවුල්කාරිත්වය රු. 1,340,000 ක ලාභයක් උපයා ඇත. 2024 අප්‍රේල් 1 වන දිනට (ඉහත ගැලපීම් කිසිවක් සිදු කිරීමට පෙර) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම් ශේෂයන් පහත දක්වා ඇත.

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් ශේෂ; | | රු.'000 |
| | නෙලුම් | 1,500 |
| | ඕලු | 1,100 |

ජංගම ගිණුම් ශේෂ;

| | |
|---|---|
| නෙලුම් | 800 බැර |
| ඕලු | 500 හර |

2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඔබ පහත සඳහන් දෑ පිළියෙල කළ යුතුය.

(i) ලාභ හෝ අලාභ විසර්ජන ගිණුම

(ii) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම් (ලකුණු 14)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 05

අ). සංකලිත වාර්ථාකරණයේ අරමුණු දෙකක් (02) සඳහන් කරන්න. (ලකුණු 04)

ආ). මූල්‍ය තොරතුරුවල ප්‍රයෝජනවත් බව වැඩි දියුණු කරන ගුණාත්මක ලක්ෂණ තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 06)

ඇ). ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38 ට අනුව පර්යේෂණ සහ සංවර්ධන පිරිවැය ගිණුම්කරණය කළ යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

ඉ). ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 15 ට අනුව අයභාරය මැනීම සහ හඳුනාගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු 20)

*"සියළුම හිමිකම් ඇවිරිණි"*